**සංස්කරණය/Editor**
අසෝක සුබසිංහ Asoka Subasinghe

**උපදේශක සංස්කාරක**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ**
**Page Layout & Graphic Designs**

සාමන්ත තැන්නගේ Saamantha Tennege

**සමබන්ධීකරණය**

| NSW | WA |
|---|---|
| Lakshman Kodituwakku | Kapila Hemantha |
| 02 9626 7660 | Balage |
| 02 9837 5055 | 08 9456 1972 |
| **QLD** | **ACT** |
| Ananda Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0400 429 031 |
| **SA** | **TAS** |
| Chandra Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

## කිලිනොච්චියෙන් ඔබ්බට

රජයේ හමුදා කොටි සංවිධානයේ හදවත වූ කිලිනොච්චිය අල්ලා ගැනීම බොහෝ ශ්‍රී ලාංකිකයනගේ අමන්දානන්ද සතුටට හේතු වූ බව රට පුරා පිළිස්සුණ රතිඤ්ඤා ප්‍රමාණයම පෙන්වා දෙයි. රජයේ හමුදා ලද මේ ජයග්‍රහණය මේ සංග්‍රාමයේ වැදගත් සන්ධිස්ථානයක් බවට සැකයක් නැත.

කොටි සංවිධානයේ පරිපාලනය යටතේ පැවති භූමිය ඔවුනගේ ග්‍රහණයෙන් නියත වශයෙන්ම ගිළිහී යන බව දැන් සහතිකය. තව දුරටත් එය සැකයක් ලෙස නොපවතිනු ඇත. දැන් ඇත්තේ කාලය පිලිබඳ ගැටලුවක් පමණකි. හෙට අනිද්දා වන විට එලිෆන්ට් පාස් මුලතිව් හා අනෙකුත් ප්‍රදේශ රජයේ හමුදා පාලනයට යට වනු ඇත.

මේ ජයග්‍රහණය දකුණ විසින් උතුර යටත් කර ගනු ලැබීමක් ලෙස අර්ථ නොදක්වන්නැයි ජනාධිපති තුමා කළ ප්‍රකාශය අතිශය වැදගත් ය. එය බුද්ධිමත් පාලකයකුගේ ප්‍රකාශයකි.

යුද්දධයකදී භූමිය අල්ලා ගැනීම වැදගත් ජයග්‍රහණයකි. මෙවන් ජයග්‍රහණ සාමාන්‍ය වැසියන් කුල්මත් කරවන බවටද සැකයක් නැත. එනමුදු භූමිය අල්ලා ගත් පමණින් මේ ප්‍රශ්ණය නිමා වේ යයි සුභවාදී වීම බුද්ධිගෝචර නැත. ආයුධ වලින් කරන යුද්ධය හා සමගාමීව සාමාන්‍ය දෙමළ ජනයා දිනා ගැනීමේ යුද්ධයද එකවර කරගෙන යාමට රජය උනන්දු විය යුතු ය. ජනතාව දිනා ගැනීමෙන් තොරව ලබා ගන්නා කිසිදු ජයග්‍රහණයක් සදාකාලික නොවේ.

රැවටීමකින් හෝ මුළා කිරීමකින් හෝ තොරව මේ ජනතාව දිනා ගන්නේ කෙසේද යන්න ගැන රජය දැඩිව කල්පනා කළ යුතු මොහොත දැන් එළැඹ තිබේ.

## නව වසර

2009 වසර ද උදා විය. මේ නැවුම් වසරාම්භයේදී සියල්ලෝම නව සිතුම් පැතුම් පොදි බඳිමින් , යහපත් අනාගතයක් ප්‍රාර්ථනා කරමින් සිටිති. "නව සිතුවිලි " , වසර ඇරඹුමේදී පමණක් නොව වසර පුරාම රඳවා ගන්නට අපි වෙහෙසෙමු. ඒ සඳහා ලෝකය යන අතට යන්නට නොව "ලෝකය යා යුතු අතට යන්නට " සන්නස ඔබ සමඟ සැරසී සිටී.

සන්නස හා අත්වැල් බැඳ ගත් ලොව දසත විසිරුණ පාඨක ලේඛක සැමට සුබ නව වසරක් වේවා..

# කකුලෙන් අදින කටවල්

"මහත්වරුනි, මේ අවස්ථා-වේදී මට එක්තරා සුළු උදාහරණයක් ඉදිරිපත් කිරීමට අවසර දෙන්න. එහෙත් ඊට පෙර මේ ගැන යමක් සිතන්න. ඔබ සතු සියලු දේපල සහ වස්තුව තක්සේරු කර ඒ වෙනුවට රත්‍රං ලබා දුන්නා යැයි මොහොතකට සිතන්න. දැන් ඔබ අතේ තියෙන්නේ ඒ රත්‍රංම පමණයි. ඊළඟට කම්බි මත ඇවිදින ප්‍රසිද්ධ සර්කස් කාරයෙකුගේ අතට එම රත්‍රං තොගය ලබාදීලා නයගරා ඇල්ල උඩින් ඇද තිබෙන කඹයක් දිගේ අනික් පැත්තට ඇවිදගෙන යන්න කියනවා. දැන් කියන්න, එබඳු අවස්ථාවකදී ඔබ එම කඹය සෙලවීමට උත්සාහ ගන්නවාද? නැත්නම් එම සර්කස් කාරයා මානසිකව ඇද වැටෙන විදිහට කෑ ගසනවාද? මා විශ්වාස කරන්නේ ඔබ කිසිසේත්ම එවැනි දෙයක් නොකරන බවයි. ඒ වෙනුවට ඔබ කරන්නේ හොඳින් හුස්ම අල්ලාගෙන, අතපය නොසොල්වා, ඔහු කිසිදු අතුරු ආන්තරාවකින් තොරව අනෙක් පසට යනතෙක් බලා සිටීම පමණක් වනු ඇත. දැන් අපේ ආණ්ඩුව දෙස බලන්න. අපේ ආණ්ඩුවේ තත්ත්වයත් ඒ වගේම දුෂ්කර අවස්ථාවකයි තියෙන්නේ. එය හරියට සුවිශාල බරක් රැගෙන මහ මුහුදක යාත්‍රා කරන නෞකාවක් වගෙයි. අපි අපට හැකි තරම් උපරිම ශක්තියෙන් කටයුතු කරගෙන යනවා. ඒ නිසා ඔබ සියලු දෙනාවම සුරක්ෂිත ලෙස එතෙර කරවන තෙක් බාධා නොකර, ඉතාමත් ඉවසීමෙන් කටයුතු කරන මෙන් මම ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා."

මෙහි ඉහත දක්වා ඇත්තේ ඇමරිකාවේ හිටපු අද්විතීය ජනාධිපතිවරයෙකු වූ ඒබ්‍රහම් ලින්කන් මහතා එක් දුෂ්කර සිවිල් යුද්ධයක් පැවැති වකවානුවකදී ඔහුව විවේචනය කළ අය අමතා කළ කතාවකින් උපුටා ගත් කොටසකි. වර්තමාන ශ්‍රී ලාංකාවේ දේශපාලන වටපිටාව දෙස බැලූ විට පාලක හා විපක්ෂයේ අය අතර හුවමාරු වන වාග් ප්‍රලාප ඉදිරියේ අපගේ මතකයට නැගුණු දෙයකි ඒ. සැබවින්ම අන්තවාදී හා දේශියත්වය උකුසට තබා බටහිරට රට පාවා දීමට ගත් නිවට නියාලු නායකයන්ගේ කුමන්ත්‍රණ ඉදිරියේ ලින්කන් ජනාධිපති තුමාගේ එම දූරදර්ශී කියමන ශ්‍රී ලාංකික ජනතාවටද අද දවසේ සිතීමට යමක් ඉතිරි නොකරන්නේද? එපමණක් නොව පක්ෂ සහ විපක්ෂ නායකයන්ටද තම තමන්නේ ක්‍රියා පටිපාටින් ගැන එම කියමන ඔස්සේ නැවත විමසා බැලීමේ හැකියාවක්ද පවතී.

අප එසේ කියන්නේ විවිධ බලවේග විසින් මොට කරන ලද දේශීය හැඟීම් නැමැති මිනී පෙට්ටියේ අවසන් ඇණය ගැසීමට සූදානම්ව සිටි කාලයක නිසි නායකත්වය හා මඟ පෙන්වීම යන කරුණු දෙක පමණක් උපයෝගී කර ගෙන දශක ගණනාවක් විසඳීමට නොහැකි යැයි සම්මතව තිබූ ජාතික ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන මානයකට අප අවතීර්ණව ඇති බව පෙනෙන - වැටහෙන - නිසාය. එහෙත් ඒ කරා යාමේදී නායකයින් වශයෙන් පෙනී සිටින බොහෝ දෙනකු තම තමන්ගේ නිරුවත් දේශපාලන භූමිකා කිසිදු විලිලැජ්ජාවකින් තොරව ජනතාව ඉදිරියේ තවමත් රඟ දක්වමින් සිටිනු පෙනේ. දියුණු ධනවත් ජාතීන් මෙන් යමෙක් ශ්‍රී ලංකාව වැනි රටකට ප්‍රශ්න සියල්ලම එක විට විසඳා ගැනීමට යෝජනා කරන්නේ නම් එයින් විද්‍යාමාන වන්නේ එසේ යෝජනා කරන තැනැත්තාගේ ඇති අනුවණකම මිස අන් කිසිවක් නොවේ. රට එක තැන පල් වීමට දශක ගණනාවක් පවතින යුද්ධය ප්‍රධානම හේතුව බව නොරහසකි. කිසියම් කෙනෙකුට රටේ සිව් කොණේම තම අණ සක පැවැත්විය හැකි වතාවරණයක් ඇති කළ හැකි නම් ඔහුට අනෙකුත් ප්‍රශ්න විසඳීම එතරම් අසීරු නොවනු ඇත. ඉමහත් ඉච්ඡාභංගත්වයෙන් කට මැත දොඩවන දේශපාලකයෝ මේ යතාර්ථය තේරුම් ගෙන ඇති බැව් පෙනේ. ඒ නිසා ඔවුන් උත්සුක වනුයේ ප්‍රධාන ප්‍රශ්නය විසදෙන්නට පෙර අප්‍රධාන ප්‍රශ්න ප්‍රධාන ප්‍රශ්න බවට පත් කර රට විනාශ වුවද හැකි තරම් ඉක්මණින් බලයට පැමිණීම නැමති එකම අරමුණ ඉටුකර ගැනීමටය. එසේ නොවුන හොත් ඔවුනගෙ බලය ලබාගැනීම නැමැති සිහිනය සදා කාලික සිහිනයක්ම බවට පත්වෙන බව ඔවුනට දැන් දැනෙන්නට පටන් ගෙන ඇත. එහෙත් ජනතාවගේ හද ගැහෙන රාවය පිළිබඳව යම් පමණක හෝ හැඟීමක් ඇත්නම් මේ ආත්මාර්ථ කාමී කටමැත දොඩවන දේශපාලකයන් තමන් දොඩවන දේ ගැන දෙවරක් සිතනු ඇත.

1521 දී ස්පාඤ්ඤ ජාතික කෝටේස් ලතින් ඇමරිකාවේ මායා ශිෂ්ඨාචාරය විනාශ කර මෙක්සිකොව ඉදි කරන ලදි. 1531 දී පිසාරෝ ඉන්කා නැමති ප්‍රාග් ඇමරිකානු ශිෂ්ඨාචාරය විනාශ කර පීරු නගරය ඉදි කරන ලදි. එහෙත් පෘතුගීසි ජාතික ලොරොන්සෝ දි අල්මේදාගෙන් ඇරඹුණු ලංකාවේ දේශීය ශිෂ්ඨාචාරය සංහාර කිරීමේ කටයුත්ත තවමත් ඉෂ්ඨ සිද්ධ කරගැනීමට නොහැකි වී තිබේ. මෙම අදීන සංස්කෘතිය විනාශ කිරීමට විදේශිකයනට කෙසේ වෙතත් ඔවුන්ගෙන් පැවත එන දේශීය නියෝජිතයන්ට තව දුරටත් ඉවසා සිටීමට නොහැකි නිසාම ඊනියා මානව හිතවාදී ලේබලයක් අලවාගෙන කරළියට පිවිස ඇත. අද මානව හිමිකම් ගැන කථා කරන්නේ එය ලෝකයේ ආයුධ වෙළඳාමට පමණක් දෙවෙනි වන වෙළඳාම නිසාය. එබඳු සෑම බලවේගයක්ම වට කොට පහර දෙනු ලැබුවද දේශීය සංස්කෘතිය තවමත් නොවැටී තිබෙන්නේ එහි පදනම එතරම්ම ශක්තිමත් නිසා මිස, නිදහසෙන් පසු රට කෙරවූ කිසිදු නායකයෙකුගේ ආනුභාවයෙන් නම් නොවන බව පැහැදිළිය. කලකට ඉහත රත්තරං මාල, බ්‍රේස්ලට් සහ පෙන්ඩන්ට් පෙන්වා බලයට

9 වන පිටුවට

සාමන්ත තැන්නගේ




**අඟ මුල සම්බන්ධ කර කථා කිරීමට නොහැකි නායකයෝ දක්ෂ කතිකයෝ නොවෙති. දක්ෂ කතිකයෝ නොවන්නේ දක්ෂ ලෙස සිතීමට නොහැකි නියාවෙනි. එබැවින් පනින්නට පෙර නොසිතන්නෝ මෙන්ම කට ඇරීමට පෙර නොසිතන්නෝද තමන් පය ගසා සිටින පොළව නොහඳුනති. එක් පයක් ඇමරිකාවේත් අනෙක් පය කිලිනොච්චියේත් තබා ගෙන සමස්ථ ශ්‍රී ලංකාව ගැන කතා කරනවාට වඩා මුනිවත රැකීම වඩාත් ප්‍රඥාගෝචරය.**